# ආඩම්බර මොණරාට පාඩමක්



සනුති නිහංසා කුමාරි මාන්නප්පෙරුම

# ආඩම්බර මොණරාට පාඩමක්

සනුති නිහංසා කුමාරි මාන්නප්පෙරුම

කර්තෘ ප්‍රකාශනයකි

කෘතිය පළ කරන දිනය : 2025.02.08

කතෘගේ වෙනත් කෘති : හිතුවක්කාර ලියෝට පාඩමක් (2023)

# පිදුම

මාගේ ආදරණීය දෙමාපියන්ටත්, ගුරුමෑණිවරුන්ට සහ ගුරුපියවරුන්ට මෙම කතාන්දර පොත් පිංචය සෙනෙහසින් පුදකර සිටිමි.

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය හා ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහනයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රත්ඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය- මහනුවර



ඔන්න පුංචි යාළුවනේ ගොඩාක් ඉස්සර කැලේට නායකයෙක් හිටියේ නෑ. ඉතිං හැමදේකටම නායකයෙක් ඕන නිසා කැලේ සත්තු තීරණය කළා කැලේට නායකයෙක් තෝරා ගන්න.

කැලේ සත්තු හැමෝම එකතුවෙලා නුවණක්කාර, එඩිතර සිංහයාව තමන්ගේ නායකයා විදියට තෝරා ගත්තා.





ඔන්න දවසක්, සිංහයා කැලේ සතුන් ලස්සන කරන්න ඕන කියලා හිතලා සත්තුන්ට ඇඳුම් බෙදාදෙන්න තීරණය කළා. හැමෝටම එන්න කියලා සතුන්ට පණිවිඩයක් යැව්වා. ඉතිං පණිවිඩේ අහලා ඇඳුම් ගන්න මුලින්ම දුවගේ ආවේ මොණරා.



සිංහ නායකයාගේ පණිවිඩේට කීකරුවෙලා මුලින්ම ආව නිසා සිංහයා මොණරට කීවා එතන තිබුණ ලස්සනම ඇඳුම තෝරා ගන්න කියලා. ඉතිං මොණරත් ඒ ඇඳුම් ගොඩේ තිබුන ලස්සනම ඇඳුම තෝරා ගත්තා. ඒ ඇඳුම ඇඳලා කැරකි කැරකි තමන්ගේ ලස්සන බැලුවා. ඇඳුම් ගන්න එතෙනට පැමිණි හැමෝම මොණරගේ ඇඳුම ගැන වර්ණනා කළා. මොණරත් ආඩම්බරක්මින් නටමින් කැලේට ගියා.



ඉතිං ඔහොම ටික කාලයක් ගතවුණා. දැන කැලේ සත්තු ඉස්සරට වඩා ලස්සනයි. සත්තු හැමෝම කතාවෙලා සිංහ රජතුමා ළගට ඇවිත් "අනේ රජතුමණී අපිට ලස්සන කටහඬවල් ලබාදෙන්න" කියලා ඉල්ලා සිටියා.

ඊට පස්සේ සිංහ රජතුමා ඒ ඉල්ලීම ඉෂ්ට කරන්න එකඟ වෙලා පසුදා සවස පැමිණෙන ලෙස කියා සිටියා. පසුදා සවස හැමෝම පෝළිමේ ලස්සන කටහඬක් ගන්න දුවගෙන ආවා.



ඒත් තමන්ගේ ලස්සන ඇදුම නිසා ආඩම්බරයට පත්වෙලා හිටපු මොණරා දින ගණනක් පහුවී ලස්සන කටහඩක් ලබාගන්න කියලා හිතාගෙන සිංහ රජතුමාව මුණගැහෙන්න ආවා. සිංහ රජතුමාට හොදටම කේන්ති ගියා.



සිංහ රජතුමා ඉතිරිවෙලා තිබුණ කටහඩවල්වලින් කැතම කටහඩ මොණරට දුන්නා. මොණරට ගොඩාක් දුක හිතුනා. මොණරා සිංහ රජතුමා ළග හඩා වැටුණා

තමන්ට ලස්සන කටහඬක් දෙන්න කියලා.මොණරා සිංහ රජතුමා ළඟ අඬ අඬා මෙහෙම කීවා.

"අනේ රජතුමණී මට සමාවෙන්න.මම මගේ ආඩම්බරකමට ඔබතුමා කියන දේ ඇහුවේ නෑ.ඒත් මට මේ කට හඬ නැතුව වෙන කටහඬක් ලබා දෙන්න. මම ආය කවදාවත් ඒ වගේ වැරැද්දක් කරන්නේ නෑ".

ඒත් සිංහ රජතුමා මෙහෙම කීවා. "බෑ බෑ මං එහෙම කළොත් කැළේ අනික් සත්තුත් මගේ අණට කීකරු වෙන එකක් නෑ. ඒ නිසා ඔබට සමාව දෙන්න බෑ".



සිංහ රජතුමා මොණරාගේ ආඩම්බරකමට දඬුවමක් විදියට කැත කටහඬම දුන්නා. අනික් සත්තු මොණරගේ කටහඬ අහන්න ආසා කලේ නෑ. ඒ නිසා මොණරා හැමදාම තමන්ගේ කටහඬ ගැන දුක් වුණා.

ඉතිං පුංචි යාළුවනේ අපිට මොනදේ තිබුනත්, අනික් අයට වඩා දක්ෂවුනත්, අනික් අයට වඩා අපි ලස්සන උනත් අපි කවදාවත් ආඩම්බර වෙන්න නම් හොද නෑ. එහෙම ආඩම්බර වීමෙන් මොණරාට වගේ පසුතැවෙන්න වෙනවා.

සමාප්තයි.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයන් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප් නැංවීම හා එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමකි. පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාවය වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබා දිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක් වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN 978-624-208-334-6